# පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

## උතුරු මැද පළාත - අනුරාධපුරය

මෙම අධිකාරියේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා තම අයදුම්පත් 2026.06.30 වන දින හෝ ඊට පෙර පහත ලිපිනය වෙත යොමු කරන මෙන් දන්වමි.

**01. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල් හා මානව සම්පත් සංවර්ධන)**

**02. ප්‍රධාන ඉංජිනේරු (මෙහෙයුම්)**

**03. විධායක ඉංජිනේරු**

**04. ඉංජිනේරු (සැලසුම් හා නිර්මාණ)**

**05. ඉංජිනේරු (සැලසුම් හා අයවැය)**

**06. ඉංජිනේරු (ද්‍රව්‍ය හා තත්ත්ව පාලන)**

**07. කාර්මික නිලධාරි**

### 01. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල් හා මානව සම්පත් සංවර්ධන)

**වැටුප් පරිමාණය** - (HM 1-1 2025) 140,640-15×4,100-202,140

**වයස් සීමාව** - බඳවා ගන්නා දිනට වයස අවු.55ට වඩා අඩු විය යුතුය. දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ, රජයේ අර්ධ රාජ්‍ය පූර්ව ආයතනයක (සංස්ථා, මණ්ඩල ව්‍යවස්ථාපිත ආයතන) සේවයේ නියුක්ත අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

**අවම සුදුසුකම් හා සේවා අවශ්‍යතා** -

01 ශ්‍රී ලංකාවේ හෝ එක්සත් රාජධානියේ වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ හෝ එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනයේ හෝ එක්සත් රාජධානියේ වරලත් සහතික කල ගණකාධිකාරිවරුන්ගේ සංගමයේ සාමාජිකයෙකු වීම

**සමග**

වසර 08ක කාලයක් ගණකාධිකාරිවරයෙකු/ අභ්‍යන්තර විගණකවරයෙකු වශයෙන් පළපුරුද්ද එයින් වසර 06ක් සුදුසුකම් ලබා ගැනීමෙන් පසු විය යුතු අතර, ඒ සමග වසර 06ක පළපුරුද්ද ඇතිව ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාලයකින් හෝ පිළිගත් වෙනත් විශ්ව විද්‍යාලයකින් ව්‍යාපාර කළමනාකරණය හෝ පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිධාරියෙකු වීම.

02. පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ අදාළ ශ්‍රේණියේ වසර 05ක සේවය සමග ගණකාධිකාරි හෝ අභ්‍යන්තර විගණක 2-1 ශ්‍රේණියේ නිලධාරියකු වීම.

**සමග**

ව්‍යාපාර කළමනාකරණය හෝ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකාවේ හෝ වෙනත් පිළිගත් විශ්ව විද්‍යාලයක පශ්චාත් උපාධිය.

### 02. ප්‍රධාන ඉංජිනේරු

**බඳවා ගන්නා ශ්‍රේණිය** - 02-I ශ්‍රේණිය

**වැටුප් පරිමාණය** - (MM 1-3 2025) 96,650-10×2,480-15×3,450-173,200

**වයස් සීමාව** - බඳවා ගන්නා දිනට වයස අවු.50ට වඩා අඩු විය යුතුය. දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ, රජයේ අර්ධ රාජ්‍ය පූර්ව ආයතනයක (සංස්ථා, මණ්ඩල ව්‍යවස්ථාපිත ආයතන) සේවයේ නියුක්ත අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

**අවම සුදුසුකම් හා සේවා අවශ්‍යතා** -

(i) (අ) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයකින් හෝ පිළිගත් වෙනත් ඕනෑම විශ්වවිද්‍යාලයකින් ලබාගත් බී.එස්.සී.උපාධිය හෝ ඒ සමාන ඉංජිනේරු සුදුසුකම් ලබා තිබීම.

**හෝ**

(ආ) ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ හෝ එක්සත් රාජධානියේ සිවිල් ඉංජිනේරු ආයතනයේ පළමුවන හා දෙවන කොටස් සමත් වී තිබීම.

**සහ**

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය එක්සත් රාජධානියේ සිවිල් ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ සාමාජිකත්වය

**හෝ**

(ii) ඉහත ආයතනය මගින් පිළිගනු ලබන වෙනත් ඉංජිනේරුවරුන්ගේ ආයතනයක සාමාජිකත්වය ලබා තිබීම.

**සමග**

වසර 06ක් ඉංජිනේරුවරයෙකු ලෙස කටයුතු කර තිබීම. ඉන් වසර 02ක් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ II වන ශ්‍රේණියේ හෝ පාලම්/මහාමාර්ග පිළිබඳ වන වෙනත් පිළිගත් සිවිල් ඉංජිනේරු සංවිධානයක ( II වන ශ්‍රේණියේ විය යුතුය)

### 03. විධායක ඉංජිනේරු

### 04. ඉංජිනේරු (සැලසුම් හා නිර්මාණ)

### 05. ඉංජිනේරු (සැලසුම් හා අයවැය)

### 06. ඉංජිනේරු (ද්‍රව්‍ය හා තත්ත්ව පාලන)

**බඳවා ගන්නා ශ්‍රේණිය** - II ශ්‍රේණිය

**වැටුප් පරිමාණය** - (MM 1-3 2025) 96,650-10×2,480-15×3,450-173,200

**වයස් සීමාව** - බඳවා ගන්නා දිනට වයස අවු.45ට වඩා අඩු විය යුතුය. දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ, රජයේ අර්ධ රාජ්‍ය පූර්ව ආයතනයක (සංස්ථා, මණ්ඩල ව්‍යවස්ථාපිත ආයතන) සේවයේ නියුක්ත අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

**අවම සුදුසුකම් හා සේවා අවශ්‍යතා - A බාහිර අයදුම්කරුවන්**

01. සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයේ ද්‍රව්‍ය/ නිර්මාණ/ඉදිකිරීම් කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

02. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදාළව ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයේ ද්‍රව්‍ය/ නිර්මාණ/ඉදිකිරීම් කටයුතු පිළිබද අවම වශයෙන් වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

03. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

04. විභාග කොමසාරිස් විසින් පවත්වනු ලබන සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයට අදාළව රජයේ කාර්මික නිලධාරි විභාගයේ (GTO) III කොටස සමත්, උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ (උ.මැ.ප.) විශේෂ ශ්‍රේණියේ කාර්මික නිලධාරියෙකු වීම.

**සමග**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු සිවිල් ඉංජිනේරු විෂය ක්ෂේත්‍රයේ ද්‍රව්‍ය/ නිර්මාණ/ඉදිකිරීම් කටයුතු පිළිබද අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**B අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත Aහි සුදුසුකම් වලට අමතරව පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ දැනටමත් ස්ථිර සේවයේ නියුතුව සිටීම හා මනා චරිතයකින් මෙන්ම කාර්යක්ෂමතාවයකින් හෙබිවීම.

### 07. කාර්මික නිලධාරි

**බඳවා ගන්නා ශ්‍රේණිය** - 03ශ්‍රේණිය

**වැටුප් පරිමාණය** - (MA 2-2 2025) 50,540-10×540-7×630-4×1,080- 20×1,280-90,270

**වයස් සීමාව** - බඳවා ගන්නා දිනට වයස අවු.45ට වඩා අඩු විය යුතුය. දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ, රජයේ අර්ධ රාජ්‍ය පූර්ව ආයතනයක (සංස්ථා, මණ්ඩල ව්‍යවස්ථාපිත ආයතන) සේවයේ නියුක්ත අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

**අවම සුදුසුකම් හා සේවා අවශ්‍යතා** -

විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන තාක්ෂණය (සිවිල්) පිළිබඳ ජාතික සහතිකය සඳහා වන විභාගය සමත් වීම.

### වෙනත් කොන්දේසි

* අයදුම්කරුවන් අයදුම්පත් කැඳවන අවසාන දිනය වන විට අදාළ සුදුසුකම් සියලුම ආකාරයෙන් සම්පූර්ණ කර තිබිය යුතුය.
* රාජ්‍ය සේවා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු/සංස්ථා/ මණ්ඩල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
* අයදුම්කරුවන් විසින් තමාගේ ජීවදත්ත අඩංගු අයදුම්පත සකස් කර එවිය යුතු අතර, තමා පිළිබඳව තොරතුරු ලබා ගත හැකි දෙදෙනෙකුගේ නම් සඳහන් කර එවිය යුතුය.
* අයදුම්කරුට විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඇත්තේ නම් එවා සැලකිල්ලට ගෙන ඉහළ ශ්‍රේණියක හෝ යම් ශ්‍රේණියක වැටුප් පරිමාණයෙහි සුදුසු වැටුප් පියවරක තබනු ලැබේ.
* අපැහැදිලි අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.
* මෙම තනතුරු සඳහා අධිකාරියේ කොන්ත්‍රාත් පදනම මත සේවය කරන නිලධාරීන්ටද අයදුම් කළ හැකිය.

**ලිපිනය** -

**සාමාන්‍යාධිකාරී,**
**පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,**
**එච්.බී.සේමසිංහ මාවත, අනුරාධපුර,**
**උතුරු මැද පළාත.**